# වාර්ෂික වාර්තාව - 2020

## සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

## මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

# 2020 වසර සඳහා කාර්යය සාධන වාර්තාව

## ආයතනයේ නම: සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

## පටුන

- කෙටි යෙදුම්

**පරිච්ඡේද**


**1. සංවිධානය**

1.1 මෙහෙවර

1.2 නීති රාමුව

1.3 සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කාර්යයන්

**2. දළ විශ්ලේෂණය**

**3. ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති සමාලෝචනය**

3.1 ක්‍රියාකාරී සැලැස්ම - 2020 *(වගුව:1)*

3.2 ක්‍රියාකාරී සැලැස්ම මත පදනම් වූ කාර්ය සාධනය *(වගුව:2)*

**4. වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

4.1 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශ

4.2 විගණකාධිපති වාර්තාව

4.3 විගණන වාර්තාවට අනුව කරුණු පැහැදිලි කිරීම

**5. මානව සම්පත් පැතිකඩ (වගුව: 3)**

# කෙටි යෙදුම්

- WBB – සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
- WBB Act – ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනත
- WB – ලෝක බැංකුව
- WBIU – සුබසාධක ප්‍රතිලාභ තොරතුරු ඒකකය
- WBS – සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- BCP – ව්‍යාපාර අඛණ්ඩ සැලසුම
- DRMS – ආපදා ප්‍රතිසාධන කළමනාකරණ පද්ධතිය
- DS – දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- HR - මානව සම්පත
- MSD – කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
- ITC – තොරතුරු තාක්ෂණ සන්නිවේදනය
- ICTA – තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය
- IIL – ඉන්ෆොමැටික්ස් ඉන්ටර්නැෂනල් ලිමිටඩ්
- IT - තොරතුරු තාක්ෂණය
- IWMS – ඒකාබද්ධ සුබසාධක කළමනාකරණ පද්ධතිය
- IEC – තොරතුරු අධ්‍යාපනික සහ සන්නිවේදනය
- SSNP – සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය
- SRIS – සමාජ ආරක්ෂණ තොරතුරු පද්ධතිය
- SRU – සමාජ ආරක්ෂණ තොරතුරු ඒකකය
- SQL – ව්‍යුහගත විමසුම් භාෂාව
- PMU – මුදල් අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
- TOR – යොමු කිරීමේ නියමයන්

# 1 වන පරිච්ඡේදය - සංවිධානය

## 1.1 මෙහෙවර

පනතේ අරමුණු සාක්ෂාත් කිරීමට අදාළව සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය සහ ශ්‍රී ලංකා සුබසාධන ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් පැනනඟින අවශ්‍යතා හඳුනාගැනීම සහ සංවර්ධනය කිරීම සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ මෙහෙවර විය. මේ අනුව, මෙහෙවර ප්‍රකාශය පහත පරිදි වේ.

"ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී විනිවිදභාවය සහ සමානාත්මතාවය සහතික කරමින් සියලුම ඉලක්කගත ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා සංගත සුබසාධන කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම".

## 1.2 නීති රාමුව

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය 2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව 2016 ජූලි මස පිහිටුවන ලද අතර එය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 පෙබරවාරි 02 වන දිනැති අතිවිශේෂ ගැසට් නිවේදන අංක 1952/22 යටතේ 2016 පෙබරවාරි 15 වන දින නැවත ක්‍රියාත්මක විය. සුබසාධක ප්‍රතිලාභ පනතේ 2 වන වගන්තියට අනුව මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ද විමසා වසර තුනක කාලයක් සඳහා 2016 ජූලි මාසයේදී මණ්ඩලයට සභාපති සහ සාමාජිකයින් සිව් දෙනෙකු පත් කරනු ලැබීය.

පනතේ ප්‍රධාන අරමුණු පහත පරිදි වේ.

- සියලු සුබසාධක ප්‍රතිලාභ ගෙවීම සඳහා නීතිමය රාමුවක් සැකසීම.
- ප්‍රතිලාභ ලබන්නන් හඳුනා ගැනීම සඳහා පාරදෘෂ්‍ය ක්‍රියාවලියක් සැකසීම.
- එවැනි ප්‍රතිලාභ අවසන් කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම.

## 1.3 සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කාර්යයන්

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටුකිරීම;

- පනත මඟින් පිරිනමා ඇති හෝ පවරා ඇති බලතල, කර්තව්‍ය සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම.
- මණ්ඩලයට පවරනු ලැබ ඇති ඕනෑම බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරි හෝ රජයේ නිලධාරියෙකු වෙත පැවරීම.

- සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රම ස්ථාපිත කිරීම.
- සුදුසුකම් ලැබීම සඳහා වන නිර්ණායක සකස් කිරීම.
- යෝජනා ක්‍රමයක් අනුව මූල්‍ය ප්‍රතිපාදන නිශ්චය කිරීම.
- යෝජනා ක්‍රමය ආරම්භ කරන  දිනය නිශ්චය කිරීම.
- ප්‍රදානය කළ යුතු මූල්‍ය හෝ වෙනත් ප්‍රතිලාභ නිශ්චය කිරීම.
- පුද්ගලයන්ට ප්‍රතිලාභ ලැබිය යුතු කාල සීමාව සඳහන් කිරීම.

## 2 වන පරිච්ඡේදය - දළ විශ්ලේෂණය

සුබසාධක ප්‍රතිලාභ පනත (2002) යටතේ පිහිටුවන ලද සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයට, සුබසාධක වැඩසටහන් වලට ප්‍රතිලාභීන් බඳවා ගැනීම, දුක්ගැනවිලි සමනය කිරීම සහ ප්‍රතිලාභ ගෙවීම සඳහා විනිවිද පෙනෙන ක්‍රියාවලියක් සකස් කිරීම සඳහා බලය ඇත. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් මූලිකව ප්‍රධාන වැඩසටහන් හතරක් ක්‍රියාත්මක කරනු ලැබේ. සමෘද්ධි දීමනා වැඩසටහන, වැඩිහිටි දීමනාව, ආබාධිත දීමනාව සහ නිදන්ගත වකුගඩු රෝගීන් සඳහා වන දීමනා වැඩසටහන් යනු එකී වැඩසටහන්ය. සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය යනු සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවීම සඳහා ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන ආධාරක ආයතනයයි.

සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාවේ සුබසාධක වැඩසටහන් වල සාධාරණත්වය, කාර්යක්ෂමතාව හා විනිවිදභාවය වැඩි දියුණු කිරීමයි. වසර පහක සාර්ථක කාලපරිච්ඡේදයක් සම්පූර්ණ කිරීමෙන් පසු, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය ඒකාබද්ධ සුබසාධක තොරතුරු කළමනාකරණ පද්ධතිය (IWMS) ලෙස හැඳින්වෙන පද්ධතියේ වගකීම් දරන ආයතනය වනු ඇත.

මෙම ඒකාබද්ධ සුබසාධක තොරතුරු කළමනාකරණ පද්ධතිය ශ්‍රී ලංකා රජයට සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. ප්‍රධාන වශයෙන් මේ තුළින් සුබසාධන සැලසීම සම්බන්ධයෙන් වන ඉලක්කගත වැඩසටහන්වල කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වර්ධනය කළ හැකිය. අප සියලුදෙනා දන්නා පරිදි, විශේෂයෙන් “සමෘද්ධි” වැඩසටනේ ප්‍රතිලාභ සාමාන්‍ය ජනතාව අතර බෙදා හැරීම සම්බන්ධයෙන් විශාල වශයෙන් අභ්‍යන්තර හා බාහිර දෝෂ තිබේ. මෙම ක්‍රමය තුළින් රටේ අඩු ආදායම්ලාභී ප්‍රජාවන්ගේ සහ හුදෙකලා කලාපවල හදිසි අවශ්‍යතා සපුරාලීම සඳහා සුබසාධක වැඩසටහන් වඩාත් විනිවිදභාවයක් හා වගවීමකින් යුතු වැඩසටහන් බවට පත් කළ හැකි අතර, දෝෂ අවම කිරීමෙන් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ජාතික මට්ටමේ වැඩසටහන් හරහා සුදුසු තේරීම් නිර්ණායක හඳුන්වා දීමෙන් ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී නිවැරදි ක්‍රියාවලිය අනුගමනය කිරීම ප්‍රවර්ධනය කළ හැකිය.

මෙයට අමතරව මෙම ක්‍රමය හරහා සමාජ සුබසාධක සේවාවන්හි ප්‍රවේශ්‍යතාවය සහ ප්‍රතිචාරාත්මක බව වැඩි දියුණු කිරීම, රජයට දැරීමට වන ගනුදෙනු පිරිවැය අඩු කිරීම සහ සැලකිය යුතු මුදලක් ආයෝජනය කිරීම සඳහා නැවත යොමුකිරීම සිදුවේ. එසේම, මෙම උපයන මුදල් රටේ වෙනත් ප්‍රදේශයක් සඳහා භාවිතා කළ හැකිය. ඒ හැරුණු විට, ඒකාබද්ධ සමාජ සුබසාධක කළමනාකරණ වැඩසටහන් සඳහා වෙන් කර ඇති සම්පත් උපරිම ලෙස භාවිතා කිරීම සහතික කිරීම, අධීක්ෂණ හා ඇගයීම් කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු, සන්නිවේදන තාක්ෂණය සහ මානව හැකියාවන් වැඩිදියුණු කළ හැකිය.

# 3 වන පරිච්ඡේදය - ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති සමාලෝචනය

## 3.1 ක්‍රියාකාරී සැලැස්ම -2020

මෙම වගුව මගින් 2020 වර්ෂය තුළ සැලසුම් කර ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.

| උපාය මාර්ග | වැඩසටහන් | ක්‍රියාකාරකම්/ උප ක්‍රියාකාරකම් |
|---|---|---|
| **1. සුබසාධක කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම / ක්‍රියාත්මක කිරීම** | | |
| 1.1 සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතියේ (SRIS) විශ්වසනීයත්වය ශක්තිමත් කිරීම. | 1.1.1 සේවාදායක සහ සේවාලාභී මෙහෙයුම් දෙකම සඳහා ආපදා ප්‍රතිසාධන කළමනාකරණ පද්ධතිය (DRMS) ක්‍රියාත්මක කිරීම. | 1.1.1.1 සේවාදායක මෙහෙයුම් සඳහා DRMS ක්‍රියාත්මක කිරීම. |
| | | 1.1.1.2 සේවාලාභී මෙහෙයුම් සඳහා ආපදා ප්‍රතිසාධන කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම. |
| | | 1.1.1.3 BCP අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත උපදෙස් බෙදා හැරීම. |
| | | 1.1.1.4 ICTA cloud හි SRIS සඳහා ස්ථාපන සේවාදායකය (Staging Server) ස්ථාපනය කර වින්‍යාසකරණය කිරීම (JDK, Tomcat, Pgadmin, Apache, Python ආදිය ස්ථාපනය කිරීම) |
| 1.2 සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතිය (SRIS) ස්ථාපනය කිරීම. | 1.2.1 අවසන් ව්‍යාපෘතිය කාර්යය අවසානය. | 1.2.1.1 SRIS කොන්ත්‍රාත්කරු විසින් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය සඳහා දැනුම හුවමාරු සැසියක් පැවැත්වීම. |
| | | 1.2.1.2 අවසන් ව්‍යාපෘතිය භාරදීම. |
| | | 1.2.1.3 SRIS හි තොරතුරු, අධ්‍යාපන, සන්නිවේදන (IEC) ද්‍රව්‍ය සකස් කර බෙදා හැරීම. |
| 1.3 දත්ත ගහනය. | 1.3.1 දත්ත සංක්‍රමණ ක්‍රියාවලිය. | 1.3.1.1 දත්ත සංක්‍රමණ සැලැස්ම සැලසුම් කිරීම. |
| | | 1.3.1.2 ක්ෂේත්‍ර සිතියම්කරණය. |
| | | 1.3.1.3 දත්ත පවිත්‍රීකරණය (cleansing). |
| | | 1.3.1.4 නියැදි දත්ත වලංගු කිරීම. |
| | | 1.3.1.5 දත්ත සංක්‍රමණය. |
| | | 1.3.1.6 සත්‍යාපනය සහ පරිශීලක පිළිගැනීම |

| | | |
|---|---|---|
| 1.4 දත්ත ගහනය. | 1.4.1. දත්ත සත්‍යාපනය සහ SRIS යාවත්කාලීන කිරීම. | 1.4.1.1 දත්ත සත්‍යාපනය සඳහා ජංගම යෙදුමක් සංවර්ධනය කිරීම. |
| | | 1.4.1.2 පවතින දත්ත සමඟ හරස් අවේක්ෂණය (cross-check). |
| 1.5 Posgresql දත්ත සමුදායන් සඳහා සේවා දායකත්වය (Cross - platform client for posture SQL databases). | 1.5.1 ප්‍රවේශන බ්‍රවුසර දර්ශන දත්ත ලබා ගැනීම සඳහා අභිරුචි SQL විමසුම් (custom SQL queries) ක්‍රියාත්මක කිරීම, විශ්ලේෂණය කිරීම සහ සංවර්ධනය කිරීම. | 1.5.1.1 CSV / JSON / XML වෙත දත්ත අපනයනය සබල කර විමසුම. |
| | | 1.5.1.2 හරස් - වේදිකා සහය (support Cross-platform support ) OSX/Linux/Windows 32/64-bit |
| **2. තිරසාර බව සහතික කිරීම** | | |
| 2.1 තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම. | 2.1.1 සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතියේ (SRIS හි) අභ්‍යන්තර පාර්ශවකරුවන් සඳහා තොරතුරු තාක්ෂණ සහ ආරක්ෂක ප්‍රතිපත්තියක් හඳුන්වා දීම. | 2.1.1.1 සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය සඳහා ප්‍රධාන සැලැස්ම / ප්‍රතිපත්ති සකස් කිරීම. |
| | | 2.1.1.2 සම්පත් දායකයින් (resource personnel) හඳුනා ගැනීම. |
| | | 2.1.1.3 තොරතුරු තාක්ෂණ සහ ආරක්ෂක ප්‍රතිපත්ති අවසන් කිරීම |
| | | 2.1.1.4 තොරතුරු තාක්ෂණ සහ ආරක්ෂක ප්‍රතිපත්ති නිල වශයෙන් අනුමත කිරීම |
| | | 2.1.1.5 SRIS පරිශීලකයින් සඳහා තොරතුරු තාක්ෂණ සහ ආරක්ෂක ප්‍රතිපත්ති අත්පොත් සංවර්ධනය කිරීම සහ බෙදා හැරීම |
| | | 2.1.1.6 සියලුම SRIS පාර්ශවකරුවන් සහ ඉහළ බලධාරීන් සඳහා තොරතුරු තාක්ෂණ සහ ආරක්ෂක ප්‍රතිපත්ති පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම |
| 2.2 ධාරිතා සංවර්ධනය. | 2.2.1 මානව සම්පත් සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. | 2.2.1.1 සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම. |
| | | 2.2.1.2 WBIU නිලධාරීන් සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම. |
| | | 2.2.1.3 SRU නිලධාරීන් සඳහා දිගුකාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම. |
| | | 2.2.1.4 SRIS කොන්ත්‍රාත්කරුගෙන් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය සඳහා දැනුම හුවමාරු සැසිය පැවැත්වීම. |

| | | |
|---|---|---|
| | | 2.2.1.5 ප්‍රාදේශීය ලේකම් කාර්යාල (DS) සඳහා දැනුවත් කිරීම් සහ පුහුණු සැසි පැවැත්වීම. |
| 2.3 SRIS හි අඛණ්ඩ වැඩිදියුණු කිරීම | 2.3.1 සමස්ත තත්ත්ව කළමනාකරණ පද්ධතිය | 2.3.1.1 රැස්වීම් සහ වැඩමුළු පැවැත්වීම. |
| | | 2.3.1.2 පුහුණු සැසි පැවැත්වීම. |
| | | 2.3.1.3 සමීක්ෂණ පැවැත්වීම |
| | | 2.3.1.4 SRIS සජීවීව ක්‍රියාත්මක වන අතරතුර තොරතුරු තාක්ෂණ විගණනය සංවිධානය කර ක්‍රියාත්මක කිරීම. |
| 2.4 වාර්තා පවත්වාගෙන යාම. | 2.4.1 තොග කළමනාකරණ පද්ධතිය | 2.4.1.1 තොරතුරු තාක්ෂණ සහ ජාල උපකරණ සඳහා වන වත්කම් තොග SRIS හා සම්බන්ධ විය යුතුය. |
| 2.5 ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීම. | 2.5.1 නවීකරණය හා අපහරණය සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සකස් කිරීම. | 2.5.1.1 SRIS සම්බන්ධ අදාළ බලධාරීන් සමඟ විධිමත් දෘඩාංග සහ වාර්තා අපහරණ ක්‍රියා පටිපාටියක් සකස් කිරීම. |
| **3. ආයතනික සැකැස්ම ස්ථාපිත කිරීම** | | |
| 3.1 ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම. | 3.1.1 SRIS (WBB/ DS) හි සජීවී ක්‍රියාකාරීත්වයට සහාය වීම සඳහා ආයතනික ව්‍යුහය ප්‍රතිව්‍යුහගත කිරීම. | 3.1.1.1 SRIS හි සජීවී මෙහෙයුම් සඳහා සහාය වීමට නව සේවක තනතුරු නිර්මාණය කිරීම සහ පවතින සේවක සංඛ්‍යාව නැවත සලකා බැලීම |
| | | 3.1.1.2 WBB හි ප්‍රතිව්‍යුහගත සංවිධාන ව්‍යුහයට සහාය වීම සඳහා යොමු නියමයන් (TOR) සකස් කර අවසන් කිරීම. |
| | | 3.1.1.3 සකස් කළ යොමු නියමයන්ට අනුව අවශ්‍යතා ක්‍රියා පටිපාටිය සහ වැඩ පැවරීම සිදු කිරීම. |
| | | 3.1.1.4 ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ මෙහෙයුම් සඳහා සහාය වීමට යොමු නියමයන් සකස් කර අවසන් කිරීම. |
| | | 3.1.1.5 සුබසාධක ප්‍රතිලාභ මණ්ඩල මට්ටමේ යටිතල පහසුකම් හඳුනා ගැනීම. |
| | | 3.1.1.6 ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ යටිතල පහසුකම් හඳුනා ගැනීම. |
| | | 3.1.1.7 සුබසාධක වැඩසටහන් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ කාර්යාල පිහිටුවීම. |
| | | 3.1.1.8 WBIU මානව සම්පත් |
| | | 3.1.1.9 WBIU අධීක්ෂණය සඳහා දත්ත සමුදායක් සංවර්ධනය කිරීම. |

| **4. අධීක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීම** | | |
|---|---|---|
| 4.1 SRIS හි දෛනික මෙහෙයුම් වලට සහභාගී වීම. | 4.1.1 SRIS පද්ධතියේ සජීවී ක්‍රියාකාරිත්වය. | 4.1.1.1 SRIS සඳහා උපකාරක (help desk) මෙහෙයුම් ස්ථාපිත කිරීම. |
| | | 4.1.1.2 පුහුණු සැසි පැවැත්වීම. |
| | | 4.1.1.3 පද්ධති නවීකරණයන් සම්බන්ධීකරණය. |
| | | 4.1.1.4 SRIS පරිශීලක කළමනාකරණ සහ අධීක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීම. |
| **5. දත්ත හුවමාරු කිරීම සහ ඒකාබද්ධ පද්ධතිය සංවර්ධනය කිරීම** | | |
| 5.1 ඵලදායී සන්නිවේදනය | 5.1.1 විධිමත් සන්නිවේදන පද්ධතියක් ස්ථාපිත කිරීම | 5.1.1.1 ව්‍යාපෘති පාර්ශවකරුවන් අතර ප්‍රමාණවත් සන්නිවේදන උපාය මාර්ග සංවර්ධනය කිරීම සහ සන්නිවේදනය කිරීම. |
| 5.2 පද්ධතිය SRIS සිට IWMS වෙත ගෙන යාම. | 5.2.1 සියලුම සුබසාධක වැඩසටහන් සහ ගෙවීම් මොඩියුලය ඇතුළුව සම්පූර්ණ පද්ධතියක් සංවර්ධනය කිරීම. | 5.2.1.1 සමාජ ආරක්ෂණ ජාලය යටතේ එන අනෙකුත් සියලුම සුබසාධක යෝජනා ක්‍රම පිළිබඳව අධ්‍යයනය කිරීම. |
| | | 5.2.1.2 විසර්ජන මොඩියුලය පිළිබඳ අධ්‍යයනය. |

*වගුව 1: ක්‍රියාකාරී සැලැස්ම - 2020*

### 3.2 ක්‍රියාකාරී සැලැස්ම මත පදනම් වූ කාර්ය සාධනය

| **1. සුබසාධක කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම / ක්‍රියාත්මක කිරීම** | |
|---|---|
| **උපාය මාර්ගය** | **ප්‍රගතිය /සටහන්** |
| 1. SRIS හි විශ්වසනීයත්ව ශක්තිමත් කිරීම. | අප විසින් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩල පරිශ්‍රය සහ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ ආවරණය කරමින් BCP සංවර්ධනය කර ඇති අතර ඉලෙක්ට්‍රොනික දත්ත උපස්ථ කිරීමේ අරමුණ සඳහා සේවාදායක යන්ත්‍රයක් මිල දී ගැනීමට යෝජනාවක් ඉදිරිපත් කර ඇත. |
| 2. SRIS පිහිටුවීම | SRIS භාරදීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් IIL සමඟ සාකච්ඡා කර ඇත. |
| 3. දත්ත ගහනය | සංක්‍රමණ දත්ත මිලියන 2.4 ක් වේදිකාගත සේවාදායකය (staging server) වෙත ආනයනය කර ඇත. |
| 4. Posgresql දත්ත සමුදායන් සඳහා සේවා දායකත්වය (Cross - platform client for postgre SQL databases) | සංක්‍රමණය වූ දත්ත පෙන්වීම සඳහා ව්‍යාපාර බුද්ධි (BI) මෙවලම සංවර්ධනය කරන ලදී. |

| | |
|---|---|
| **2. තිරසාර බව සහතික කිරීම** | |
| 1.තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම. | සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය සඳහා මූලික තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් සකස් කර ඇති අතර ඒ සඳහා වෘත්තීය ආයතනයක් හරහා උපදෙස් ලබා ගත යුතුය. |
| 2. ධාරිතා සංවර්ධනය | SRIS හි තිරසාරභාවය පවත්වා ගැනීම සඳහා WBIU නිලධාරීන් සඳහා මාර්ගගත පුහුණු වැඩසටහන් පවත්වන ලදී. |
| 3. SRIS හි අඛණ්ඩ වැඩිදියුණු කිරීම. | SRIS හි තත්ත්වය ප්‍රකාශ කිරීම සඳහා විවිධ පරිපාලන මට්ටම්වල (දිස්ත්‍රික්/ ප්‍රාදේශීය) රැස්වීම් සහ පුහුණු කිරීම් පවත්වන ලදී. |
| 4. වාර්තා පවත්වාගෙන යාම. | SRIS සඳහා වත්කම් තොග කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කරන ලදී. |
| **3. ආයතනික සැකැස්ම ස්ථාපිත කිරීම** | |
| 1. ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම. | පවතින WBB සංවිධාන ව්‍යුහය අවලංගු කරන ලදී. එහි සංයුතියේ විශාල ව්‍යුහාත්මක වෙනසක් ඇති කිරීමට අවශ්‍ය බව හඳුනාගෙන ඇත. |
| **4. දත්ත හුවමාරු කිරීම සහ ඒකාබද්ධ පද්ධතිය සංවර්ධනය කිරීම** | |
| 1. පද්ධතිය SRIS සිට IWMS වෙත ගෙන යාම. | SRIS හි සීමාවන් හඳුනාගෙන SRIS සිට IWMS වෙත සංක්‍රමණය වීමට මූලික ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම IWMS SRIS හි දිගුවක් ලෙස ක්‍රියා කරනු ඇත. |

*වගුව 2: ක්‍රියාකාරී සැලැස්ම මත පදනම් වූ කාර්ය සාධනය*

# 4 වන පරිච්ඡේදය - සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 4.1 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශ

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සන්සන්දනාත්මක ආදායම් ප්‍රකාශය**

| විස්තරය | සටහන | 2020 | 2019 නැවත නිකුත් කරන ලද |
|---|---|---|---|
| **ආදායම** | | | |
| රජයේ ප්‍රදාන | 1 | 5,082,645.00 | 7,967,266.00 |
| **වියදම්** | | | |
| පුද්ගල වැටුප් | 2 | 4,901,808.00 | 7,093,495.00 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 3 | 894,088.00 | 1,624,458.00 |
| | | 5,795,896.00 | 8,717,953.00 |
| **වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)** | | **(713,251.00)** | **(750,687.00)** |

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | සටහන | 2020 | 2019 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **සංරචක 01** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 4 | 330,681.52 | 3,318,772.51 |
| **ජංගම වත්කම්** | | | |
| ලැබීම් | 5 | | 50,000.00 |
| | | **330,681.52** | **3,368,772.51** |
| **මූල්‍යකරණය කළේ** | | | |
| ශුද්ධ වත්කම් / ස්කන්ධය | | | |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 4,584,793.00 | 4,584,793.00 |
| සමුච්චිත අතිරික්තය/ (හිඟය) | | (4,257,134.80) | (1,224,224.47) |
| මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය | | 327,658.20 | 3,360,568.53 |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | 6 | 3,023.32 | 8,203.58 |
| | | **330,681.52** | **3,368,772.51** |

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය**

| | දේපළ පිරියත හා උපකරණ සංචිතය | සමුච්චිත අතිරික්තය/ (හිඟය) | එකතුව |
|---|---|---|---|
| 2017/01/01 දිනට ශේෂය | | | |
| දේපළ පිරියත හා උපකරණ(PPE) සංචිතය | 3,773,670.00 | | 3,773,670.00 |
| වසර සඳහා PPE සංචිතය | 811,123.00 | | |
| වර්ෂය සඳහා අතිරික්තය/ (හිඟය) | | (72,390.08) | (72,390.08) |
| 2017/12/31 දිනට ශේෂය | **4,584,793.00** | **(72,390.08)** | **3,701,279.92** |
| | | | |
| | **දේපළ පිරියත හා උපකරණ සංචිතය** | **සමුච්චිත අතිරික්තය/ (හිඟය)** | **එකතුව** |
| 2018/01/01 දිනට ශේෂය | 4,584,793.00 | (72,390.08) | 4,512,402.92 |
| වසර සඳහා PPE සංචිතය | - | - | - |
| වර්ෂය සඳහා අතිරික්තය/ (හිඟය) | - | (353,195.07) | (353,195.07) |
| 2018/12/31 දිනට ශේෂය | **4,584,793.00** | **(425,585.15)** | **4,159,207.85** |
| | | | |
| | **දේපළ පිරියත හා උපකරණ සංචිතය** | **සමුච්චිත අතිරික්තය/ (හිඟය)** | **එකතුව** |
| 2019/01/01 දිනට ශේෂය | 4,584,793.00 | (425,585.15) | 4,159,207.85 |
| විගණන ගාස්තු-2018 | - | (47,952.00) | (47,952.00) |
| වර්ෂය සඳහා අතිරික්තය/ (හිඟය) | - | (750,687.32) | (750,687.32) |
| 2019/12/31 දිනට ශේෂය | **4,584,793.00** | **(1,224,224.47)** | **3,360,568.53** |
| | | | |
| | **දේපළ පිරියත හා උපකරණ සංචිතය** | **සමුච්චිත අතිරික්තය/ (හිඟය)** | **එකතුව** |
| 2020/01/01 දිනට ශේෂය | - | (1,224,224.47) | (1,224,224.47) |
| පෙර වසරේ ක්ෂය වීම | - | (2,319,659.61) | (2,319,659.61) |
| වර්ෂය සඳහා අතිරික්තය/ (හිඟය) | - | (713,250.72) | (713,250.72) |
| 2020/12/31 දිනට ශේෂය | **-** | **(4,257,134.80)** | **(4,257,134.80)** |

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | **2020** |
|---|---|
| | රු. ශත. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | |
| වර්ෂය තුළ අතිරික්තය/ (හිඟය) | (713,250.72) |
| වැඩිවන මෙහෙයුම් පිරිවැය | - |
| ගැලපීම: | |
| ක්ෂය වීම | 1,201,302.27 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **488,051.55** |
| පෙර වසර ගැලපීම් | (47,952.00) |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ (වැඩිවීම /අඩුවීම) | (5,180.66) |
| ලැබිය යුතු දෑ (වැඩිවීම /අඩුවීම) | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදිත ශුද්ධ මුදල් | **434,918.89** |
| | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | |
| දේපල,පිරියත සහ උපකරණ මිලදී ගැනීම | - |
| ආයෝජන කටයුතු සඳහා යොදා ගන්නා ලද ශුද්ධ මුදල් | - |
| | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය** | |
| කල්බදු ගෙවීම් | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් | - |
| | |
| වර්ෂය තුළ මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම | 434,918.89 |
| වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ | - |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ** | **434,918.89** |
| | |

**වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමානකම් විශ්ලේෂණය කිරීම**

ඇමුණුම් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

**පොදු කරුණු**

1.1 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1952/22 අති විශේෂ ගැසට් නිවේදනය යටතේ 2016 පෙබරවාරි 15 වන දින යළිත් ක්‍රියාත්මක වන 2002 අංක 24 සුබසාධක ප්‍රතිලාභ පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය 2016 ජූලි මාසයේදී ස්ථාපිත කරන ලදී.

1.2 සුබසාධක ප්‍රතිලාභ පනතේ 2 වන වගන්තියට අනුව ව්‍යවස්ථාදායක සභාව සමඟ සාකච්ඡා කර මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති විෂය භාර අමාත්‍යවරයා විසින් වසර තුනක කාලයක් සඳහා 2016 ජූලි මාසයේදී පත් කරන ලද සභාපති සහ සාමාජිකයින් සිව් දෙනෙකුගෙන් මණ්ඩලය සමන්විත වේ.

1.3 සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය මහලේකම් කාර්යාලය, කොළඹ 01 හි මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ලේ 1 වන මහලේ පිහිටා ඇත.

1.4 සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ අරමුණු

- ප්‍රධාන අරමුණ, සියලු සුබසාධක ප්‍රතිලාභ ගෙවීම සඳහා කාර්යය රාමුවක් සැලසීම.
- ප්‍රතිලාභ ලබන්නන් හඳුනා ගැනීම සඳහා විනිවිදභාවයෙන් යුතු ක්‍රියාවලියක් සැකසීම.
- එවැනි ප්‍රතිලාභ අවසන් කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම.

සුබසාධක ප්‍රතිලාභ පනත මගින් ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම පිණිස සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයට බලය ලබා දී ඇත.

- පනත මගින් ලබා දී ඇති හෝ පවරා ඇති බලතල, රාජකාරි සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම.
- මණ්ඩලයට පවරා ඇති බලතල දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරි හෝ රජයේ නිලධාරියෙකුට පැවරීම.
- සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රම ස්ථාපිත කිරීම.
- සුදුසුකම් සඳහා වන නිර්ණායක සැකසීම.
- යෝජනා ක්‍රමයක් අනුව මූල්‍ය ප්‍රතිපාදන සඳහන් කිරීම.
- යෝජනා ක්‍රමය ආරම්භ කරන දිනය නිශ්චය කිරීම.

- ප්‍රදානය කළ යුතු මූල්‍ය හෝ වෙනත් ප්‍රතිලාභ නිශ්චය කිරීම.
- ප්‍රතිලාභ ලැබීමට පුද්ගලයන්ට හිමිකම් ඇති කාල සීමාව සඳහන් කිරීම.

1.5. මූල්‍ය ප්‍රකාශනය

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය ප්‍රකාශන මෙමඟින් ඉදිරිපත් කරයි.

## 02. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්ත්වය පිළිබඳ විස්තීර්ණ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වියදම් ප්‍රකාශය, එහි ජංගම නොවන වත්කම් ලැයිස්තුව, මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන් යන ලැයිස්තුන්ගෙන් සමන්විත වේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශය ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ රජයේ මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

2.1 මූල්‍ය හා ඉදිරිපත් කිරීමේ මුදල්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ රුපියල්වලින් ඉදිරිපත් කරනු ලැබේ.

2.2 අඛණ්ඩ පැවැත්ම

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් සැලසුම් කරන ලද පහත දක්වා ඇති ප්‍රතිපත්ති, සුබසාධක ප්‍රතිලාභ සඳහා සුදුසු ක්‍රමවේදයක් වන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනයන්ට අදාළ වේ.

2.3 පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදාගෙන ඇති අතර වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකරන්නේ නම් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති වසර තුනක කාල සීමාවන්ට එය අඛණ්ඩව අදාළ කර ගැනීමට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය අපේක්ෂා කරයි.

- **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

  සියලුම කාර්යාල උපකරණ ආරම්භයේදී පිරිවැයට වාර්තා කරනු ලබයි. උපකරණවල පිරිවැය යනු මිලදී ගැනීමේදී එකතු කළ අගය මත බද්ද සමඟ අත්පත් කර ගැනීමේ දී දරණ ලද පිරිවැයයි.

- **විස්තීර්ණ ආදායම් ප්‍රකාශ**

  (අ) ආදායම් හඳුනා ගැනීම

  ආදායමක් ලෙස සැලකෙන රජයෙන් ලැබෙන අග්‍රිම

(ආ) වියදම් හඳුනා ගැනීම

වියදම් ප්‍රකාශයේදී වියදම්, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ පරිපාලන හා සාමාන්‍ය වියදම්, සුබසාධක ප්‍රතිලාභ වියදම් හා සන්නිවේදන වියදම් ලෙස හඳුනාගනී. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය පවත්වාගෙන යාම සඳහා වන සියළුම වියදම්, වියදම් ප්‍රකාශයට ගෙන ඇත.

(ඇ) ක්ෂයවීම

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙන් පවරන ලද වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදන වෙන්කර නොමැත. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් මිලදී ගෙන ඇති වත්කම් පමණක් ක්ෂයවීම ගණනය කරන ලදී.

වත්කම්වල ඇස්තමේන්තුගත ආයුකාලය අනුව සරල මාර්ග පදනම මත පහත දැක්වෙන පරිදි ක්ෂය ගණනය කරනු ලැබේ.

| | |
|---|---|
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 20% |
| යන්ත්‍රෝපකරණ | 33.33% |

(ඈ) බදුකරණය

උපයනවිට ගෙවීම් බද්ද දේශීය ආදායම් පනතේ 01 වගුව මත පදනම් වේ.

**4.2 විගණකාධිපති වාර්තාව**

**සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා ඔහු විස්තීරණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 එක ව්‍යවස්ථාව සමග සංශෝධිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධාන අනුව මාගේ වාර්තාව නියමිත කාලය තුළ දී පාර්ලිමේන්තුවේ සභා ගත කරනු ඇත.

2020 දෙසැම්බර් 01 දිනට මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූල ව මා විසින් විගණනය සිදු කරන ලදී. එම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම එම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ

වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී මණ්ඩලය අඛණ්ඩව පවත්වා ගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර කළමණාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම සම්බන්ධ පාර්ශව විසින් දරණු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යාම අවශ්‍ය කෙරේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සඳහා මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මගේ අරමුණයි. මේ සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑම විටම ප්‍රමාණවත් වග, සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි, තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතු ව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තව ද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදු වන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟ හැරීම

හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හා තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුව ද අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකි ය.
- හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේ දි මා විසින් හඳුනා ගන්නා ලද අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු දුර්වලතා ඇතුළුව අනෙකුත් කරුණු අතර සැලකිය යුතු විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් හා පාලනය සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින අය සමඟ මම සන්නිවේදනය කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

### 2.1. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය විසින් පවත්වා ගෙන ගොස් තිබුණි.

2.1.2. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප විය.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

**2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුළ පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.**

2.2.1. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍ය ආකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර නොමැති බව.

2.2.3. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර නොමැති බව.

2.2.4. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාව සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**3. වෙනත් කරුණු**

(අ) විගණනයට සපයා ඇති ක්‍රියාකාරී සැලැස්මට අනුව 2020 වර්ෂය අවසාන වන විට නිම කිරීමට නියමිත ක්‍රියාකාරකම් වන සේවාදායක මෙහෙයුම් සඳහා ආපදා ප්‍රතිසාධන කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම, සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතිය (SRIS) ස්ථාපනය කිරීම සහ සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතිය මඟින් දැනුම හුවමාරු කිරීමේ සැසියක් පැවැත්වීම, සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතියේ අභ්‍යන්තර පාර්ශවකරුවන් සඳහා තොරතුරු තාක්ෂණ හා ආරක්ෂක ප්‍රතිපත්තියක් හඳුන්වා දීම, පූර්ණ තත්ත්ව

කළමනාකරණ පද්ධතිය සඳහා සමීක්ෂණ පැවැත්වීම, සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධති සඳහා තොරතුරු තාක්ෂණ විගණනය සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදුවෙමින් පවතී. සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතියට සම්බන්ධ අදාළ බලධාරීන් සමග විධිමත් දෘඩාංගයක් සහ වාර්තා බැහැර කිරීමේ ක්‍රියා පටිපාටියක් සංවර්ධනය කිරීම, සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතියේ සජීවී ක්‍රියාකාරීත්වයට සහාය වීම සඳහා සංවිධාන ව්‍යුහය ප්‍රතිව්‍යුහගත කිරීම සහ විධිමත් සන්නිවේදන පද්ධතියක් ස්ථාපනය කිරීම යනාදී ක්‍රියාකාරකම් සැලැස්මට අනුව සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) අනුමත සේවක සංඛ්‍යාව වූ 18 හා සසඳන විට 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සත්‍ය සේවක සංඛ්‍යාව නමයක් විය. එබැවින්, සභාපති තනතුර ඇතුළුව තනතුරු නමයක් පුරප්පාඩුව පැවති අතර සියලුම සේවකයින් වැඩ බලන, ද්විතීයන යන පදනමින් සහ තාවකාලික පදනමින් බඳවා ගෙන තිබුණි. එමෙන්ම, මණ්ඩලය 2016 වර්ෂයේ දී ස්ථාපනය කර තිබුණ ද 2020 දෙසැම්බර් 31 දින දක්වාම බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

අත්.කළේ./ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

## 4.3 විගණන වාර්තාවට අනුව කරුණු පැහැදිලි කිරීම

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | WBB/ACCT/Au/Quarry/2020 | ඔබේ අංකය / உமது இல / Your No | TRE/BWBB/01/20/42 | දිනය / திகதி / Date | 2021.07.05 |

S.M.D.S. සුදේශ් රෝහිත මහතා,
නියෝජ්‍ය විගණකාධිපති,
විගණන කාර්යාලය,
මහා භාණ්ඩාගාරය..

<u>1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (අ) වගන්තිය ප්‍රකාර ව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ ඇතුළුව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කටයුතු පිළිබඳ විගණකාධිපතිවරයාගේ සවිස්තර කළමනාකරණ විගණන වාර්තාව</u>

මෙය ඉහත විෂය පිළිබඳ 2021 ජූනි 09 දිනැති ඔබගේ අංක : TRE/B/WBB/01/20/42 දරණ ලිපිය හා බැදේ.

ඉහත වාර්තාවේ 2 වන කොටස සඳහා අපගේ නිරීක්ෂණ පහත පරිදි වේ.

**2.1** මූල්‍ය ප්‍රතිඵල

නිරීක්ෂණය සමඟ එකඟ වේ.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1
3.2 <u>ව්‍යාපෘතියේ ප්‍රාග්ධන කටයුතු ප්‍රමාදයන්. සහ මානව සම්පත් කළමනාකරණය</u>

සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතිය (SRIS) කළමනාකරණ ලේඛනය මුදල් අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා අනුමැතිය අපේක්ෂාවෙන් සිටිමු. සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (SSNP) දැනටමත් දත්ත සත්‍යාපන යෙදුම් සංවර්ධනය කිරීම සම්පූර්ණ කර ඇත. පුහුණු ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. Covid-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ අවිනිශ්චිතතාවය නිසා කාලානුරූප ඉලක්කයේ අභියෝගය වැඩි විය හැකි ය.

සේවක සංඛ්‍යාව අනුමත කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම් සමඟ සාකච්ඡා කර ඇත.

| | | | | | |
|---|---|---|---|---|---|
| කාර්යාලය / அலுவலகம் / Office | Tel: 009411- 2151481<br>009411- 2484600/4117<br>Fax 009411- 2151482 | විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail | welfarebenefitboard2016@gmail.com<br>info@www.wbb.gov.lk | වෙබ් අඩවිය / இணையதளம் / Website | www.wbb.gov.lk |

තවද, 2020 වර්ෂයේ දී ඉහත කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමේ හැකියාව පිළිබඳ ව ඔවුන් තීරණය කරනු ඇත.

මේ සම්බන්ධයෙන් ඔබගේ සහයෝගය ඉතා අගය කොට සලකමි.

අත්. කළේ./එම්.එම්.සී.පී.මොහොට්ටිගෙදර

අතිරේක කොමසාරිස් (වැඩබලන)

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

Office } Tel: 009411- 2151481
009411- 2484600/4117
Fax 009411- 2151482

e-mail } welfarebenefitboard2016@gmail.com
info@[illegible].wbb.gov.lk

Website } www.wbb.gov.lk

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | WBB/ACCT/Au/Quarry/2020 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | TRE/BWBB/01/20/42 | දිනය<br>திகதி<br>Date | 2021.07.05 |

S.M.D.S. පුදේශ් රෝහිත මහතා,
නියෝජ්‍ය විගණකාධිපති,
විගණන කාර්යාලය,
මහා භාණ්ඩාගාරය.

<u>**1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ආ) වගන්තිය ප්‍රකාරව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශය සහ අනෙකුත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ සවිස්තර කළමනාකරණ විගණන වාර්තාව**</u>

මෙය ඉහත විෂය පිළිබඳ 2021 ජුනි 30 දිනැති ඔබගේ අංක : TRE/B/WBB/01/20/42 දරණ ලිපිය හා බැඳේ.

**කරුණු අංක 2.3.1. සහ 2.3.2.** පහතින් පැහැදිලි කරනු ඇත.

සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතිය (SRIS) කළමනාකරණ ලේඛනය මුදල් අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා අනුමැතිය අපේක්ෂාවෙන් සිටිමු. සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (SSNP) දැනටමත් දත්ත සත්‍යාපන යෙදුම් සංවර්ධනය කිරීම සම්පූර්ණ කර ඇත. පුහුණු ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. Covid-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ අවිනිශ්චිතතාවය නිසා කාලානුරූප ඉලක්කයේ අභියෝගය වැඩි විය හැකි ය.

සේවක සංඛ්‍යාව අනුමත කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම් සමඟ සාකච්ඡා කර ඇත. තව ද, 2020 වර්ෂයේ දී ඉහත කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමේ හැකියාව පිළිබඳ ව ඔවුන් තීරණය කරනු ඇත.

මේ සම්බන්ධයෙන් ඔබගේ සහයෝගය ඉතා අගය කොට සලකමි.

අත්. කළේ./එම්.එම්.සී.පී.මොහොට්ටිගෙදර
අතිරේක කොමසාරිස් (වැඩබලන)
සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

කාර්යාලය / அலுவலகம் / Office } Tel: 009411- 2151481, 009411- 2484600/4117, Fax 009411- 2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail } welfarebenefitboard2016@gmail.com, info@wmm.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website } www.wbb.gov.lk

## 5 වන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

| රැකියා බාණ්ඩය | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|---|
| | සභාපති / කොමසාරිස් | 1 | - |
| HM 1-1 | අතිරේක කොමසාරිස් | 1 | 1 (වැඩබලන) |
| MM 1-1 | නියෝජ්‍ය කොමසාරිස් | 1 | - |
| MM 1-1 | සහකාර කොමසාරිස් | 1 | - |
| HM 1-3 | ගණකාධිකාරී | 1 | 1 (වැඩබලන) |
| MA - 3 | සංවර්ධන නිලධාරී | 1 | 1 (මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය අමාත්‍යාංශය මඟින් අනුයුක්ත කර ඇත). |
| MA 1-2 | කළමනාකරණ සහකාර | 2 | 1 (මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය අමාත්‍යාංශය මඟින් අනුයුක්ත කර ඇත). |
| PL-1 | කාර්යාල කාර්ය සහායක | 2 | 2 (මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය අමාත්‍යාංශය මඟින් අනුයුක්ත කර ඇත). |
| PL-3 | රියදුරු | 2 | - |
| | මෘදුකාංග සංවර්ධක | 1 | 1 (කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇත). |
| | පද්ධති පරිපාලක | 1 | 1 (කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇත). |
| | තොරතුරු තාක්ෂණ විධායක | 2 | 1 (කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇත). |
| | හෙල්ප් ඩෙස්ක් ක්‍රියාකරු | 3 | - |

*වගුව 3 : මානව සම්පත් පැතිකඩ*